**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල - 2014**

---------------------------------------------------------

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ 08 (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 02. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇතිවන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආපනශාලා බදු දීමේදී ලබාගෙන තිබූ රු. 1,764,000 වූ තැන්පත් මුදල් සහ සත්ව ආහාර සැපයුම්කරුවන් විසින් තබන ලද ඇප තැන්පත් රු. 2,388,358 ක් අරමුදලේ ජංගම බැරකම් යටතේ දක්වනවා වෙනුවට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද වැට් බදු රු. 31,996,982 ක් ආදායම් බදු ලෙසට ආදායම් ප්‍රකාශයෙහි බදු පෙර ලාභයෙන් අඩුකර දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | නොනිමි වැඩ (වාගොල්ල නව සත්වෝද්‍යානය, සෆාරි උද්‍යානය හා දෙහිවල සත්වෝද්‍යානයේ ඉදිකිරීම්වලට අදාල) | 756,763,930 | භෞතික වැඩ නිමකර තිබූ ඉදිකිරීම්වල 2014 වර්ෂයට පෙර දරන ලද පිරිවැය වෙන් වෙන්ව දැක්වෙන උපලේඛන |
| (ආ) | සමරු පොත් | 2,032,544 | 2012 වර්ෂයේදී බෙදා හැර තිබුණු පොත් පිළිබඳ බෙදා හැරීමේ ලේඛන |
| (ඇ) | ණය හිමියන් | 340,982 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ඈ) | ප්‍රවේශ පත්‍ර තොගය | 3,306,042 | තොග සත්‍යාපන වාර්තා |
| (ඉ) | සමරු භාණ්ඩ තොගය | 7,168,059 | තොග සත්‍යාපන වාර්තා |

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම්වල ප්‍රතිඵලය රු.550,500,998 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.415,114,491 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 135,386,507 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ සමස්ථ ආදායම රු.187,403,875 ක වැඩිවීමක් දක්නට ලැබුණු අතර, වියදමද රු. 46,328,652 කින් වැඩිවී තිබුණි. තවද, සමස්ත ප්‍රවේශ පත්‍ර ආදායම පසුගිය වර්ෂයේ ආදායමට සාපේක්ෂව රු. 147,533,970 ක ශුද්ධ වැඩිවීමක්වී තිබූ නමුත්, දෙහිවල සත්වෝද්‍යානයෙන් ලද ආදායම පසුගිය වර්ෂයේ ආදායමට සාපේක්ෂව රු. 1,322,390 කින් අඩුවී තිබුණි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

**4.1 කාර්යසාධනය**

**4.1.1 නරඹන්නන්ගේ පැමිණීම සහ ආදායම**

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයෙහි දෙහිවල සත්වෝද්‍යානය සහ පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි නරඹන්නන් සංඛ්‍යාව සහ එමඟින් ලද ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දෙහිවල සත්වෝද්‍යානය

| | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම |
| | | රු. | | රු. |
| දේශීය | 1,249,562 | 98,383,110 | 1,429,322 | 112,079,300 |
| විදේශීය | 28,823 | 46,895,300 | 27,120 | 34,521,500 |
| එකතුව | 1,278,385 | 145,278,410 | 1,456,442 | 146,600,800 |

දෙහිවල සත්වෝද්‍යානයට පැමිණි විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සසඳන විට 1,703 කින් හෙවත් සියයට 6 කින් වැඩිවී තිබූ අතර, එමඟින් මුළු ආදායම රු. 12,373,800 කින් හෙවත් සියයට 35 කින් වැඩිවී තිබුණි. එහෙත් දේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව හා ආදායම පිළිවෙලින් 179,760 කින් සහ රු. 13,696,190 කින් අඩුවී තිබුණි.

(ආ) පින්නවල අලි අනාථාගාරය

| | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම |
| | | රු. | | රු. |
| දේශීය | 444,483 | 32,601,730 | 437,628 | 33,115,310 |
| විදේශීය | 320,040 | 698,887,000 | 278,740 | 549,517,060 |
| එකතුව | 764,523 | 731,488,730 | 716,368 | 582,632,370 |

පින්නවල අලි අනාථාගාරයට පැමිණි විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 41,300 කින් හෙවත් සියයට 15 කින් වැඩිවී තිබූ අතර, එමඟින් ලද ආදායම රු. 149,369,940 කින් හෙවත් සියයට 27 කින් වැඩිවී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී දේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව 6,855 කින් හෙවත් සියයට 9 කින් වැඩිවී තිබුණි. එහෙත් දේශීය නරඹන්නන්ගෙන් ලැබුණු ආදායම රු. 513,580 කින් අඩුවී තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සත්ව අවශ්‍යතා පිළිබඳ ලේඛනයක් සකස් කර තිබුණද, එය සකස් කිරීමේදී ඒ සඳහා පත්කළ කමිටුවක් මඟින් සිදුකර නොතිබූ අතර, ප්‍රගතිය පරීක්ෂා කළ හැකි පරිදි වාර්තාවක් පිළියෙල කර අමාත්‍යාංශය වෙතද ඉදිරිපත් කර නොතිබුණි. තවද සත්වෝද්‍යානයේ සිට මියගිය සතුන් වෙනුවෙන් අලුතෙන් සතුන් මිලදී ගැනීම සඳහා වූ වැඩ පිළිවෙලක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වටිනාකම රු. 95,222,500 ක් වූ අලි ඇතුන් 16 දෙනෙකු බාහිර පාර්ශවයන්ට රැකබලා ගැනීම සඳහා ලබාදී තිබූ අතර, වර්ෂයේ අවසන් දිනට එම සතුන්ගේ පැවැත්ම තහවුරු කරගෙන නොතිබුණි.

## 4.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රායෝගිකව වැඩ අවසන් කරන ලද කොන්ත්‍රාත් 70 කට අදාළ රු. 1,488,565,804 ක බිල්පත් වටිනාකම් නොනිමි වැඩ ලෙස ශේෂ පත්‍රයේ දක්වා තිබුණි. මෙම වියදම්වලට අදාළ ගෙවීම් අරමුදලින් කරන ලද සහ දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ කරන ලද වියදම් වශයෙන් වෙන්කර නොගැනීමත්, ගෙවීම්වලට අදාළ බිල්පත්වල මිල විචලනයන් පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා ස්වාධීන ආයතනයක් වෙත ඉදිරිපත් කර තිබුණත් ඒවා නිරවුල් කරගෙන නොතිබීම නිසා ඉදිකිරීම් ආයතනවලට තම අවසන් බිල්පත් ඉදිරිපත් කිරීමට නොහැකිවී පැවතීම නිසාත් වැඩ අවසන් කරන ලද ඉදිකිරීම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට නොහැකිව තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------

සමාලෝචිත වර්ෂය තුළ දෙහිවල, පින්නවල සහ හම්බන්තොට සෆාරි යන උද්‍යානවල සතුන් සඳහා සත්ව ආහාර සැපයීමේ ලංසු තුනක් සම්බන්ධයෙන් තෝරා ගන්නා ලද පළමු ලංසුකරු සැපයීම සඳහා ඉදිරිපත් නොවීම නිසා දෙවන ලංසුකරු වෙතද, තවත් කොන්ත්‍රාත් දෙකක් සම්බන්ධයෙන් දෙවන ලංසුකරුද ඉදිරිපත් නොවීම නිසා තෙවන ලංසුකරුටද ආදී වශයෙන් ඊලඟ ලංසුකරුවන් වෙත සැපයුම් කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

ඉකුත් වර්ෂවලදීද මෙම තත්ත්වය නිරීක්ෂණය වූ අතර, සැපයුම්කරුවන්ගේ සැපයීමේ හැකියාව පිළිබඳ සනාථන (මූල්‍යමය හැකියාව, බැංකු ගිණුම්, පසුගිය වර්ෂවල ගිණුම් ප්‍රකාශ) සහ නෛතික හා සංවිධානාත්මක තත්ත්වය පිළිබඳව (ලියාපදිංචි සහතික ආදී) අරමුදල සැලකිල්ලක් නොදැක්වීම හේතුවෙන් මෙසේ ලංසු භාර නොගැනීමට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා රු.515,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද වර්ෂයේ වියදම රු. 739,223,871 ක් වූයෙන් රු. 224,223,871 ක් ඇස්තමේන්තුව ඉක්මවා වැයකර තිබීමෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 06. පද්ධති හා පාලනයන්

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ලේඛන පවත්වාගෙන යාම
(ඈ) සත්ව ආහාර ප්‍රසම්පාදනය
(ඉ) තොග පාලනය